**ශීර්ෂය 187 - ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය**

**-------------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

---------------

**1.1 මතය**

------

ශීර්ෂය 187 - ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 25 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 මැයි 23 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

-------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකිම**

------------------------------------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

**(අ) මූලධන වියදම්**

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ මූලධන වියදම් ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ACA-C ආකෘතිය ප්‍රකාරව පිළියෙළ කර ඇති මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළ මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයක් ලෙස එක් එක් වැය ශීර්ෂයන්ට අදාළ වටිනාකම රු.411,378 ක් වූ අධිහාර ශේෂයන් වෙනමම අධිහාර ලෙස හඳුනා තිබුණි. | එම ඡේදයෙහි සඳහන් කරුණ සම්බන්ධයෙන් එකඟ වන අතර, අධිහාර ලෙස සඳහන් වී ඇති රු.411,378 ක මුදල අපගේ වැය විෂයන් සඳහා කරන ලද අධිහාර වන අතර වැරදීමකින් එය මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි අධිහාර ලෙස සඳහන් කර ඇති බව. | වියදම් නිවැරදිව වර්ගීකරණය කර මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළ පෙන්විය යුතුය. |

**(ආ) ගනුදෙනු බේරා අවසන් කිරීමේ අත්තිකාරම් ගිණුම්**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අමාත්‍යාංශය විසින් විවිධ කාර්යයන් සඳහා නිකුත් කර සෑම අතුරු අග්‍රිමයකම වියදම් නොකර නැවත පියවා ඇති මුදල නිකුතු මුදලෙන් සියයට 50 ඉක්මවා ඇති බව විගණනයේදී නිරීක්ෂණය වූ බැවින් අතුරු අග්‍රිම නිකුත් කිරීමේදී නිවැරදි ඇස්තමේන්තුවකින් තොරව මුදල් අවභාවිතයක් වන බව තවදුරටත් නිරීක්ෂණය විය. | විවිධ කාර්යයන් සඳහා අතුරු අග්‍රිම ලබා ගැනීමේදී නිවැරදිව ඇස්තමේන්තු කිරීමකින් තොරව අග්‍රිම ලබා ගෙන ඇති බව පිළිගනිමි. ඉදිරියේදී විවිධ කාර්යයන් සඳහා අතුරු අග්‍රිම ලබා ගැනීමේදී නිවැරදිව ඇස්තමේන්තු කිරීම් කර අග්‍රිම ලබා ගන්නා ලෙස නිලධාරීන්ට උපදෙස් ලබා දුන් බව. | නිවැරදිව ඇස්තමේන්තු සකස් කළ යුතුය. |

**(ඇ) තැන්පතු**

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ තැන්පත් ගෙවීම් හා ශේෂ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ACA-4 ආකෘතිය ප්‍රකාරව පිළියෙළ කර ඇති 2022 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම් පිළිබඳ ප්‍රකාශයේ 2022 ජනවාරි 01 දිනට ශේෂය ලෙස රු.912,678 ක් හඳුනා ගෙන තිබුණි. රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමණාකරණ රාජ්‍ය අමාත්‍යාංශයේ අභ්‍යන්තර කටයුතු අංශය 2022 ඔක්තෝබර් 01 දින සිට නව අමාත්‍යාංශයක් ලෙස මෙම අමාත්‍යාංශය පිහිටුවා ඇති බැවින් පැරණි අමාත්‍යාංශයට අදාළව රු.912,678 ක තැන්පත් ශේෂයක් මෙම අමාත්‍යාංශයේ ආරම්භක ශේෂය ලෙස හඳුනා ගෙන ඇති නමුත් එය තැන්පත් ලැබීමක් ලෙස භාණ්ඩාගාර පොත් වල හඳුනා ගෙන තිබුණි. එම නිසා, ACA-F ආකෘතිය ප්‍රකාරව පිළියෙළ කර ඇති මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ ආදායම් නොවන ලැබීම් ලෙස හඳුනා ගෙන ඇති තැන්පතු ලැබීම් රු.912,678 ක් අඩුවෙන් ඇතුළත් කර තිබුණි. තවද, ACA-7 ආකෘතිය ප්‍රකාරව පිළියෙළ කර ඇති අග්‍රිම සැසඳුම් ප්‍රකාශයද එම වටිනාකමෙන් අධිගණනය වී තිබුණි. | පිළිගනිමි.<br><br>2022 සැප්තැම්බර් 30 න් පසු අමාත්‍යාංශ වෙන් වීම මත ගිණුම් වල ආරම්භක ශේෂ මාරු කිරීමේදී පොදු තැන්පත් ගිණුමේ ශේෂය, අමාත්‍යාංශයේ පොත්වල ආරම්භක ශේෂය ලෙසත් ජ'නල් පත්‍ර දැමීමේදී හර සහ බැර ලෙසත් ඉදිරිපත් කිරීම නිසා වැරදීමක් සිදුවී ඇත. නමුත් අවසාන ශේෂයේ වෙනසක් නොමැති අතර, 2023 වර්ෂයේ සිට නිවැරදිව ගිණුම් පවත්වාගෙන යාම සඳහා නිළධාරීන්ට උපදෙස් ලබා දුන් බව කාරුණිකව දන්වමි. තවද ACA-F ආකෘතිය ප්‍රකාරව පිළියෙල කර ඇති මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයද පොදු තැන්පත් ගිණුමට අදාලව සිදුකරන ලද ගැලපීමේ වැරදීම නිසා අදාල වෙනස්කම් සිදු වී ඇති බව කාරුණිකව සඳහන් කරමි. | ආකෘතීන් නිවැරදිව සකස් කළ යුතුය. |

**(ඇ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | මු.රෙ.891 (1) හි සඳහන් තොරතුරු ඇතුළත් වන පරිදි ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ ඇප ලේඛනයක් පවත්වා ගත යුතු වුවද එසේ පවත්වාගෙන නොතිබුණි. | මු.රෙ.891(1) අනුව ඇප ලේඛනයක් නඩත්තු කිරීමට කටයුතු කරනු ලබන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ලේඛණ පවත්වාගෙන යා යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) | සම්මත ණය ලේඛනය (සී.සී 10), සම්මත ණය ලේඛනය පවත්වා ගෙන යා යුතු උපදෙස් අනුව පවත්වාගෙන ගොස් නොතිබුණි. | සම්මත ණය ලේඛනය පවත්වා ගෙන යා යුතු උපදෙස් අනුව පවත්වාගෙන යාමට උපදෙස් ලබා දී ඇති බව. | සම්මත ණය ලේඛනය පවත්වා ගෙන යා යුතු උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |
| (iii) | අතිකාල සඳහා වෙන්වූ නියමිත ආකෘතිය ප්‍රකාරව අතිකාල වැඩ ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. | අතිකාල සඳහා නියමිත පරිදි ආකෘතිය ප්‍රකාරව ලේඛනයක් පවත්වා ගෙන යන ලෙස උපදෙස් දි ඇති බව. | නියමිත ආකෘතිය ප්‍රකාරව අතිකාල වැඩ ලේඛනයක් පවත්වා ගෙන යා යුතුය. |
| (iv) | ණය පාලන ගිණුමක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | ණය පාලන ගිණුම සඳහා ලේඛනයක් පවත්වා ගෙන යන ලෙස උපදෙස් දි ඇති බව. | ණය පාලන ගිණුමක් පවත්වාගෙන යා යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

----------------------

### 2.1 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

-------------------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

**නිරීක්ෂණය**

| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | | | |
| | රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, වැවිලි කර්මාන්ත හා පර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් 1997 පෙබරවාරි | අතිකාල දීමනා ගෙවීම් මසකට පැය 20ක උපරිමයකට සීමා කල යුතු වුවද තනතුරු 4ක් සඳහා පහත පරිදි අතිකාල පැය 20 උපරිම සීමාව ඉක්මවා ගෙවීම් සිදුකර තිබුනද ඒ එක් එක් තනතුරු සඳහා ඉක්මවූ | අතිකාල සම්බන්ධ රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ අංක 19 අනුව ලේඛන සකස් කිරිමට සහ අදාළ අනුමැතිය ලබා ගැනීමට | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | 03 වැනි දින නිකුත් කරන ලද අංක 8/97 චක්‍රලේඛය සහ ආයතන සංග්‍රහයේ VIII වන පරිච්ඡේදයේ 7.1 වගන්තිය | අතිකාල පැය ගණන සඳහා සමාලෝචිත වර්ෂයට අදාලව අනුමැතිය ලබා ගෙන නොතිබුණි. මසකට හිමි අතිකාල පැය ගණන කා.කා.ස. හා කළමනාකරණ සහකාර තනතුරු සඳහා පරය 100 බැගින්ද සංවර්ධන නිලධාරීන් සඳහා පැය 80 බැගින්ද රියදුරු සඳහා පැය 150 බැගින්ද ලබාදී තිබුණි. | නිලධාරින්ට උපදෙස් ලබා දී ඇති බව. | |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) | මුදල් රෙගුලාසි 315 | ගණන්දීමේ නිළධාරීන් ලෙස සෑම දෙපාර්තමේන්තු ප්‍රධානියෙකු විසින්ම ඇප තැබිය යුතු නිළධාරීන් විසින් ඇප තබන බවට වල බලා ගත යුතු වුවද අමාත්‍යාංශය විසින් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | - එම - | - එම - |
| (ii) | මුදල් රෙගුලාසි 756(6) | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ සිදුකර අවසන් කිරීමේ කාල රාමුව අනුව කටයුතු කර නොතිබුණි. | ඉදිරි වර්ෂ වලදී භාණ්ඩ සමීක්ෂණ හා වාර්ථා කිරීම් කටයුතු වලට අදාල චක්‍රලේඛ ප්‍රකාරව නියමිත කාලවකවානුවන් තුල සියලු කාර්යයන් සිදු කරන ලෙස අදාල නිලධාරීන්ට උපදෙස් ලබා දෙන ලද බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| **(iii)** | මුදල් රෙගුලාසි 880 | මුදල්, ආදායම් මුද්දර හෝ බඩු බාහිරාදිය භාර ගැනීම හෝ භාරව සිටීම, එසේ නැතහොත් රජයේ මුදල් බෙදාහැරීම හෝ මුද්දර නැතහොත් බඩු බාහිරාදිය නිකුතු කිරීම, | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කිරීමට උපදෙස් ලබා දෙන ලද බව. | - එම - |

| | | | | |
|---|---|---|---|---|
| | | සම්බන්ධයෙන් පරිපාලනමය වශයෙන් වගකිවයුතු හෝ බලය පැවරීම යටතේ එම කටයුතු පවරනු ලැබ ඇති හෝ නිලධාරීන්ද රජයේ ගිණුමට අදාල වව්චර් සහතික කරන චෙක්පත් අත්සන් කරන අයද 612 වැනි අධිකාරිය වන රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා අනුව ඇප තබා නොතිබුණි. | | |
| **(iv)** | මුදල් රෙගුලාසි 881 | ඇප තැබිය යුතු තනතුරකට නිලධාරියෙකු පත්කිරීමේදී හෝ එවැනි තනතුරකට මාරු කිරීමේදී එකී නිලධාරියා විසින් එකී තනතුරකට පත්කළ දින සිට හෝ මාරු කළ දින සිට දෙමසක් ඇතුලත ඇප තැබීම කළ යුතු වුවද එවැනි තනතුරුවල සේවය කරන ඇප තැබිය යුතු නිලධාරීන් කවරෙක්ද යන්න හඳුනාගෙන හෝ නොතිබුණි. | - එම - | **- එම -** |

**3. මෙහෙයුම් සමාලෝචනය**

--------------------------

**3.1 සැලැසුම් කිරීම**

-----------------

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 සහ 04 ඡේද ප්‍රකාරව 2022 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර නොතිබුණි. | 2022 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුන බව පිලිගනිමි. 2023 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර අනුමත කර ඇති බව**.** | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**3.2 වත්කම් කළමනාකරණය**

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022/06 අයවැය චක්‍රලේඛයේ සඳහන් උපදෙස් මත රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ ශීර්ෂය (442) යටතේ ඇති රු.56,116,974ක් වටිනා වත්කම් 187 නව ශීර්ෂය වෙත මාරු කර තිබුණු අතර නව අමාත්‍යාංශයේ වත්කම් CIGAS වැඩසටහනට ඇතුළත් කිරීමේදී නව තක්සේරු වටිනාකම ලෙස රු.61,460,914ක් ඇතුළත් කර තිබුණි. 01/2020 රාජ්‍ය මුදල් චක්‍රලේඛය II කොටසේ 8.1.5 වන වගන්තිය ප්‍රකාරව එසේ පවරා ගන්නා වත්කම් වල පොත් අගය හා තක්සේරු වටිනාකම අතර වෙනස වන රු.2,649,140 නිසි අනුමැතියක් නොමැතිව ගිණුම් වලට ඇතුළත් කර තිබුණි. | රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමණාකරන රාජ්‍ය අමාත්‍යාංශය CIGAS වැඩසටහනට ඇතුලත් කරන ද්විගණනය වූ මාරු පත්‍රයනිවැරදි කිරීමට අපහසු බැවින් වත්කම් සියල්ල නැවත තක්සේරු කර ගිණුම්ගත කිරීමට උපදෙස් ලද බව. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | මෙසේ හඳුනා ගන්නා ලද නව මූලධන වත්කම් තුළ රු.2,694,800ක් වටිනා වත්කම් කිසිදු අනුමැතියකින් තොරව අමාත්‍යාංශයේ වත්කම් ලෙස හඳුනා ගෙන තිබුණි. | මෙහි සඳහන් කර ඇති වත්කම් සියල්ල රාජ්‍ය ආරක්ෂක අංශයට හා ඊට අයත් ආයතන වෙත අප විසින් ගිණුම් කටයුතු සිදු කරන කාල පරිච්ඡේදය තුල මිලදී ගෙන පවරා දුන් වත්කම් බව. | අදාළ අනුමැතීන්ට යටත්ව වත්කම් ගිණුම්ගත කලයුතුය. |
| (ඇ) | අමාත්‍යාංශය සතුව 2004 වර්ෂයේ මිලදී ගත්/ පවරා ගත් වාහනයක්ද, 2007 වර්ෂයේ මිලදී ගත්/ පවරා ගත් වාහන 03ක්ද, 2011 වර්ෂයේ මිලදී ගත්/ පවරා ගත් වාහන 04ක් සහ 2013 | අමාත්‍යාංශය සතු වාහන ලියාපදිංචිය, අයිතිය මාරු කිරිමට හා අමාත්‍යාවරයාගේ කාර්ය මණ්ඩලය වෙනුවෙන් ලබා දි ඇති වාහන වලට අදාලව විධිමත් පරිදි | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| වර්ෂයේ මිලදී ගත්/ පවරා ගත් බජාජ් මෝටර් බයිසිකලය වශයෙන් වාහන 09ක් වූ අතර අමාත්‍යාංශය ආරම්භ කර මාස 06ක කාලයක් ගත වී තිබුණද අමාත්‍යාංශය නමින් ලියාපදිංචි වී නොතිබුණි. තවද අමාත්‍යාවරයාගේ කාර්ය මණ්ඩලය වෙනුවෙන් මුදල් අමාත්‍යාංශය විසින් තාවකාලික පදනම මත ලබා දී ඇති වාහන 05ක් භාවිතයේ පවතින අතර ඒ සම්බන්ධයෙන් කොම්ප්ට්‍රෝලර් ජනරාල්වරයා විමසා ආයතනය නමින් ලියාපදිංචි කර ගැනීමට හෝ නැවත පවරා දීමට කටයුතු කර නොතිබුණි. ඒ අනුව කොම්ප්ට්‍රෝලර් ජනරාල්වරයා විසින් වත්කම් සම්බන්ධයෙන් වරින් වර නිකුත් කර ඇති චක්‍රලේඛයන්ට පටහැනිව වත්කම් භාරයේ තබා ගනු ලබන බවට විගණනයට නිරීක්ෂණය විය. | අමාත්‍යාංශය වෙත පවරා ගැනිම සඳහා අදාළ චක්‍රලේඛන අනුව කටයුතු ආරම්භ කර ඇති බව. | |

## 4. යහපාලනය

## 4.1 අභ්‍යන්තර විගණනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 133 හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වන වගන්තිය ප්‍රකාරව, 2022 වර්ෂය සඳහා අමාත්‍යාංශය විසින් අභ්‍යන්තර විගණකවරයෙකු පත් කර අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා පවත්වා ගෙන ගොස් නොතිබුණි. | 2022 වර්ෂයේ සිට අභ්‍යන්තර විගණකවරයකු පත්කර ගැනිම සිදු නොවුනද, නව අභ්‍යන්තර විගණන නිලධාරියකු යටතේ 2023 වර්ෂයේ අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපනය කර ඇත. | මුදල් රෙගුලාසි සහ ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**4.2 විගණන හා කළමනාකරණ කමිටුව**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 41 වන වගන්තිය ප්‍රකාරව විගණන සහ කළමණාකරණ කමිටුවක් පත් කර රැස්වීම් පවත්වා නොතිබුණි. | 2023 වර්ෂයේ පළමු කාර්තුවේ විගණන කළමණාකරන කමිටු රැස්වීම පවත්වන ලද බව කාරුණිකව දන්වා සිටිමි. | ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**5. මානව සම්පත් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | ඒ අනුව සමාලෝචිත වර්ෂයේදී ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 03 ක් ද තෘතීය සහ ද්විතීය මට්ටමේ පුරප්පාඩු 08 ක් ද සහ ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 06 ක් ද වශයෙන් පුරප්පාඩු 17 ක් පැවතිණි. | ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය 2022 ඔක්තෝබර් 01 දින සිට ස්ථාපනය කරන ලද්දේ අයවැය චක්‍රලේඛ 2022/06 අනුව 442 රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමණාකරන අමාත්‍යාංශයේ අභ්‍යන්තර කටයුතු වැඩසටහන 187 වැය ශීර්ෂය වන ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයේ වැඩ සටහනට ඇතුලත් කිරිම සමග, එම අංශයට අනුයුක්තව සිටි නිලධාරීන් ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලය ලෙස සලකන ලදි. | නිසි අධ්‍යනයකින් පසුව අනුමත කාර්යය මණ්ඩලය සුදුසු පරිදි සංසෝදනය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවේ 2023 ජනවාරි 24 දිනැති නව තනතුරු ඇති කිරීම හා පුරප්පාඩු සම්පූර්ණ කිරීම යන ලිපිය මගින් ඉහත රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමණාකරන රාජ්‍ය අමාත්‍යාංශයේ අභ්‍යන්තර කටයුතු අංශයේ කාර්ය මණ්ඩලය යටපත් කර ආයොජන ප්‍රවර්ධන අමාත්‍යාංශය සඳහා තනතුරු 21 කට අදාලව කාර්ය මණ්ඩලය සඳහා 72 ක සංඛ්‍යාවක් අනුමත කර තිබුණි. එසේ වුවද ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 305 ක සේවයේ යෙදී සිටින සංවර්ධන නිලධාරීන් මෙම අමාත්‍යාංශයේ අනුමත කාර්ය මණ්ඩලයට විගණිත දින දක්වා ඇතුලත් කර නොතිබිණි. | අපනයන සංවර්ධන මණ්ඩලය ප්‍රධාන කාර්යාලයේ හා උප කාර්යාල 04 හි සහ දිවයින පුරා වූ ප්‍රදේශිය ලේකම් කාර්යාල වෙත අනුයුත්ත කරන ලද මධ්‍යම රජයෙන් වැටුප් ලබන සංවර්ධන නිලධාරින් 305 අමාත්‍යාංශයේ අනුමත කාර්ය මණ්ඩලයට ඇතුලත් කර අමාත්‍යාංශ මුළු කාර්ය මණ්ඩලය සඳහා අනුමැතිය 2023.01.31 වන දින අංක MIP/02/13/EDB/20 දරණ ලිපිය මගින් ඉල්ලා ඇත. | - එම - |